2012

කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

வருடாந்த நிருவாக மற்றும் நிதி அறிக்கை

Annual Performance & Accounts Report

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මහනුවර

மாவட்ட செயலகம் - கண்டி

District Secretariat-Kandy

කාර්ය සාධන හා ගිණුම් වාර්තාව - 2012

வருடாந்த நிருவாக மற்றம் நிதி அறிக்கை - 2012

Annual Performance Report & Accounts -2012

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර

மாவட்ட செயலகம் - கண்டி

District Secretariat - Kandy

පෙළගැස්ම

	පිටු අංකය
1. දිස්ත්‍රික් ලේකම්ගේ පණිවිඩය	1-5
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම	6
2.1 දර්ශනය හා මෙහෙවර	7
2.2 තත්ත්ව ප්‍රතිපත්තිය	8
2.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්	9-10
3. මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම	11-14
3.1 පරිපාලන සිතියම	15
3.2 මූලික තොරතුරු	16
4. සංවිධාන ව්‍යුහය	17
4.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය	18
4.2 අංශ අනුව කාර්ය මණ්ඩලය	19-20
5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය	21-27
6. සාමාන්‍ය පරිපාලනය	
6.1 ආයතන අංශ කටයුතු	28-31
6.2 විවිධ මහජන ඉල්ලීම්, ලිපි, පෙත්සම් සහ මහජන ඉඩම් ගැටළු	31
6.3 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ කටයුතු	32
6.4 අභ්‍යන්තර විගණන කටයුතු	33
6.5 දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු කටයුතු -	34 35
6.6 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කටයුතු	35-36
6.7 පුහුණු හා මානව සම්පත් සංවර්ධන කටයුතු	
6.7.1 පුහුණු වැඩසටහන්	37-39
6.7.2 මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු	40
6.7.3 ඵලදායිතා වැඩසටහන්	40
7. ව්‍යවස්ථාපිත කටයුතු හා අනෙකුත් රාජකාරි	
7.1 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකයේ කටයුතු	41-42
7.2 මෝටර් රථ ප්‍රවාහන කටයුතු	43
7.3 පුපුරන ද්‍රව්‍ය අංශයේ කටයුතු	44
7.4 පාරිභෝගික සේවා අධිකාරියේ කටයුතු	45
7.5 මිනුම් ඒකක ප්‍රමිති සේවා කටයුතු	45
7.6 පරිසර කටයුතු	46
7.7 සංඛ්‍යා ලේඛණ කටයුතු	46

8. සමාජ සේවා හා සංස්කෘතික

8.1	බෞද්ධ කටයුතු හා සංස්කෘතික කටයුතු	47-49
8.2	සමාජ සේවා කටයුතු	49
8.3	සමාජ ආරක්ෂණ කටයුතු	50
8.4	ළමා ආරක්ෂණ කටයුතු	51
8.5	ජාතික ඒකාබද්ධතා කටයුතු	52
8.6	කුඩා ව්‍යාපාර සංවර්ධන කටයුතු	52-53
8.7	දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන කටයුතු	53-54

9. සංවර්ධන කටයුතු

9.1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් කටයුතු	55-57
9.2	දිස්ත්‍රික් ආයෝජන වැඩසටහන	58-62
9.3	දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන කටයුතු	63-64
9.4	කෘෂිකර්ම කටයුතු	65
9.5	රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් දෙපාර්තමේන්තු ගෙවීම් විස්තර	66

10.	දෙමළ පරිවර්තනය	67-146
11.	ඉංග්‍රීසි පරිවර්තනය	147-211
12.	ගිණුම් වාර්තාව	212-234

මනා පරිපාලන හා සංවර්ධන ක්‍රමෝපායන් තුලින් ජනහිතකාමී තිරසර සංවර්ධනයක් කරා ...

ශ්‍රී ලංකාවේ අවසාන රාජධානිය වන කන්ද උඩරට මහනුවර ලෝක උරුම නගරයක් ලෙස ලෝක වාසි බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ බදු ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ සෙවනෙහි මහත් වූ ආශිර්වාදයෙන් පිහිටා ඇති ස්වභාව සෞන්දර්යෙන් මෙන්ම සෞම්‍ය වූ දේශගුණයකින් පොහොසත් වූ දිස්ත්‍රික්කයක් ලෙස ලංකාවාසින්ගේ මෙන්ම ලෝකවාසින්ගේ ද ගෞරව ආදරයට පාත්‍ර වූ සුවිශේෂී දිස්ත්‍රික්කයකි.

ව්‍යවස්ථාපිත කටයුතු

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2012 වර්ෂය තුල ද අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විවිධ උත්සාහයන් උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබූ අතර පෙරහැර භාරයේ කටයුතු ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු පාරිභෝගික ආරක්ෂණ ,කිරුම් මිණුම් ,මැතිවරණ ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ හා දිස්ත්‍රික් සංවර්ධන ආදි සියලු කමිටු කැඳවීම් හා මෙහෙයවීම් ,සංස්කෘතික ,සමාජ සේවා හා සමාජ ආරක්ෂණ ,ආපදා කළමනාකරණ, පුරාවිද්‍යා ආදි විවිධ ව්‍යවස්ථාපිතව පැවරී ඇති සියලු කටයුතු සාර්ථකව ඉටු කරනු ලැබීය.

අභ්‍යන්තර පරිපාලනය ශක්තිමත් කිරීම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පරිපාලනය ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා ප්‍රථමයෙන් කාර්ය මණ්ඩලය සමඟ ඉතාම සමීපව සුහදශීලිව කටයුතු කිරීමටත් ඒ තුලින් සංවර්ධනාත්මක ආකල්ප වලින් හෙබි කාර්ය මණ්ඩලයක් දක්වා පරිවර්තනයක් සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියලුම අංශ මසකට වරක් හෝ දෙවරක් ඒ ඒ අංශවල ප්‍රගතිය ‘‘ගැටළු’’ වැඩිදියුණු කිරීමේ යෝජනා සාකච්ඡා කර තීරණ ගැනීමෙන් අංශ අතර අන්‍යෝන්‍ය සබැඳියාවකින් යුතුව ශක්තිමත් පරිපාලනයකට මනා පිටුවහලක් විය.

එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාල පරිපාලනය පළාත් පාලන පරිපාලනය සහ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධතාවයකින් පරිපාලන හා සංවර්ධනාත්මක කටයුතු වලට දායකවීමෙන් ධනාත්මක ආකල්ප වලින් හෙබි කාර්ය මණ්ඩලයක් සමඟ ශක්තිමත් පරිපාලන පද්ධතියක් ගොඩනංවා ගැනීමට හැකිවිය. එපමණක් නොව අනෙකුත් රේඛීය අමාත්‍යාංශ ,සංස්ථා, මණ්ඩල, අධිකාරී, බැංකු, රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගලික අංශ සහ ජනතාව එක්ව කටයුතු කිරීමෙන් හොඳ සම්බන්ධතාවයක් ගොඩනැගුණු අතර, එතුලින් කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා/ආකල්ප හුවමාරුකර ගැනීමත් සමඟ අභ්‍යන්තර පරිපාලනය පරිණතවුවා පමණක් නොව එමඟින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සංවර්ධනය සහ සුභසාධනයට මහත් අස්වැසිල්ලක් විය.

දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය පරිපාලනය

ඉහත සඳහන් ගුණාත්මක අභ්‍යන්තර පරිපාලනයෙන් බලාපොරොත්තු වනුයේ එමඟින් ජනතා සිතුම් පැතුම් වලට සමීප ප්‍රාදේශිය පරිපාලනයක් හා ප්‍රාදේශිය සංවර්ධනයක් ඇති කිරීමයි .ඒ සඳහා සාම්ප්‍රදායික ප්‍රාදේශිය පරිපාලනයෙන් ඔබ්බට ගොස් ප්‍රාදේශිය ලේකම් සමුළු පැවැත්වීම, ඵලදායිතා වැඩසටහන් හා ඵලදායිතා තරඟ තුලින් කඩිනම් ඵලදායිතා ක්‍රමවේද, උපායමාර්ග හඳුන්වා ක්‍රියාත්මක කිරීම තුලින් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20ම එකම පරිපාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීමෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල සියල්ලම එක සමාන කාර්ය සාධන මාවතක් කරා යොමු වීමෙන් එහි ප්‍රගතිය මැනීම, අධීක්ෂණයද ඉතා පහසු විය .එසේම ප්‍රාදේශිය හා ග්‍රාමීය පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා වන නව ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඉදිකිරීම, ප්‍රාදේශිය ලේකම් නිල නිවාස ඉදිකිරීම ,අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම සමඟ අත්‍යවශ්‍ය භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම ඉතා හොඳ මට්ටමින් සිදු වූ අතර ශක්තිමත් ග්‍රාමීය පරිපාලනයට අත්වැලක් වන අංග සම්පූර්ණ ග්‍රාම නිලධාරී කාර්යාල සේවා පියස කාර්යාල ලෙස ඉදිකිරීම ඉතා සිඝ්‍රයෙන් සිදු වූ අතර ආදර්ශ ග්‍රාම නිලධාරී කාර්යාල වැඩසටහන සාර්ථකව ක්‍රියාවට

නංවනු ලැබීය. ඒ තුලින් ග්‍රාමීය පරිපාලනය ශක්තිමත්වූ අතර ගැමී ජනතාවට හොඳ සේවයක් ලබාගත හැකි විය.

ආගමික හා සදාචාර සංවර්ධනය

සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රය තුළ නව පිබිදීමකට හේතු වන පරිදි කටයුතු කරන්නට හැකි වුවාසේම එය කාර්ය මණ්ඩලයට හා මහජන සේවාව සඳහාද බද්ධ කර ගැනීමට හැකිවිය .ශ්‍රී බුද්ධ වර්ෂ 2556 රාජ්‍ය වෙසක් උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2012 මැයි මස 05, 06, 07 යන දිනවල මහනුවරදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.එයට සමගාමීව වෙසක් කූඩු හා සැරසිලි නිර්මාණය කිරීම හා තරඟ පැවැත්වීමත් දන්සල් පැවැත්වීමත් සිදු කෙරිනි. ඇසළ පෙරහැර උළෙල සාර්ථකව පැවැත්වීම "සිරි දළදා අභිවන්දන" නමින් ප්‍රකාශනය මෙවර ද නිකුත් කිරීම, ඇසළ පෙරහැර සමයේ ඇසළ පෙරහැර මෙහෙයුම් මධ්‍යස්ථානය මෙහෙයවීමත්, රාමඤ්ඤ නිකායේ 65 වන උපසම්පදා මහෝත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමත්,දිස්ත්‍රික් සාහිත්‍ය උළෙල සාර්ථකව නිම කිරීමත්, අස්ගිරි මහා විහාරයට වසර 700 ක් පිරීම නිමිත්තෙන් අස්ගිරි මහා විහාරයේ මහා නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් උත්සවය පැවැත්වීම, ඉන් පසුව අතිගරු ජනාධිපතිතුමාගේ 3 වන පදවි ප්‍රාප්තිය නිමිති කොට ගෙන 2012.11.18 වන දින ශ්‍රී දළදා මාලිගාවේ දී සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වන ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්ය මණ්ඩලයේ අධ්‍යාත්මික ගුණ වගාව වර්ධනය කිරීම තුළින් යහපත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමත්,සාහිත්‍ය තුළින් මහජන ප්‍රසාදය රාජ්‍ය සේවය වෙත ලබාගැනීමේ අරමුණින් දිස්ත්‍රික් සාහිත්‍ය උළෙල උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීය.

සේවක සුභ සාධනය

සුභ සාධන කටයුතු වෙනුවෙන් ඉහල අවධානයක් යොමු කරමින් නිලධාරීන් අතර සුහදතා වර්ධනයට හේතුවන ආගමික හා විනෝද චාරිකාවල නිරත වීම, විශේෂිත පොහෝ දිනයන් නිමිත්තෙන් ධර්ම දේශනා හා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද මහනුවර දිස්ත්‍රික් රාජ්‍ය ආයතන හා නිලධාරීන් අතර ක්‍රීඩා තරඟයක් පවත්වා සහතික හා කුසලාන පිරිනැමීම, සේවක මණ්ඩලය සඳහා විවේක කාමරයක් ස්ථාපිත කිරීම.

මාධ්‍ය සම්බන්ධීකරණය.

යහපත් පරිපාලනයක් පවත්වාගෙන යාමේ දී හා සංවර්ධන තොරතුරු ජනතාව වෙත රැගෙන යාමේ දී අවශ්‍ය වන පරිදි මාධ්‍ය සම්බන්ධීකරණය සාර්ථකව පවත්වාගෙන යන ලදි .සංවර්ධන තොරතුරු ජනතාව වෙත රැගෙන යාමේ අභිලාෂයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සෙංකඩගල වින්ති පුවත් පත ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කිරීම ද kandy e news පද්ධතිය පවත්වාගෙන යාමද අඛණ්ඩව සිදුකල කටයුත්තකි.

දිස්ත්‍රික් සම්බන්ධීකරණය හා මිත්‍රශීලි යහපාලනය

මෙම වසර පුරාම මධ්‍යම රජයේ සියලු අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු ,සංස්ථා ,මණ්ඩල ,ආයතන හා මධ්‍යම පළාත් සභාවේ සියලු ආයතන සමඟත් රාජ්‍ය නොවන සංවිධාන සමඟත් ඒකාබද්ධ වී මිත්‍රශීලි පරිපාලනයක් ක්‍රියාත්මක කරමින් මහජනයා වෙත ඉහළ සේවාවක් සැපයීමට සමත්විය .මෙම වසරේ දී ද ජාතික නිදහස් දින උළෙල, ජාතික ආරක්ෂක දිනය, ජාතික උත්සව හා වැඩසටහන් ගණනාවක්ම සාර්ථකව පවත්වන්නට හැකි විය.

තොරතුරු තාක්ෂණය භාවිතය

තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම හා ඊට අදාල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු වල ඉහල ප්‍රගතියක් පෙන්වීමට සමත් වූ අතර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වය

යටතේ ආරම්භ කළ දිස්ත්‍රික් නිල වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීන කිරීම, ICTA ආයතනයේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන e-government ජාලකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා එහි ප්‍රතිලාභ කාර්ය මණ්ඩලය වෙත ලබා දීම, ග්‍රාම නිලධාරීන් වෙත තොරතුරු තාක්ෂණය ගෙන යාමට කටයුතු කිරීමද එතුළින් තැන්නේකුඹුර ග්‍රාම නිලධාරී විසින් "ගම්පති" නමින් වෙබ් අඩවියක් ආරම්භ කිරීම, රාජ්‍ය කළමානාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය අනුග්‍රහයෙන් නිපුණතා ප්‍රවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම, මෙම වසර තුල තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග විය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හේතු පාදක වන පරිදි කාර්ය මණ්ඩලයේ භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන් අතර ජාතික ඒකා බද්ධතා ඒකකයේ අනුග්‍රහයෙන් පවත්වන ලද දෙමළ භාෂා පාඨමාලා III අදියරෙන් ආරම්භ කර පසුව II හා I අදියරයන් දක්වා පාඨමාලා පැවැත්වීම වැඩිදියුණු කිරීම ද සිදු විය.

රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සහභාගිත්වය

රාජ්‍ය නොවන සංවිධාන 104 ප්‍රමාණයක් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක අතර ප්‍රජා සහභාගිත්වය හා ප්‍රජාවගේ සංවර්ධනය පිළිබඳ සැබෑ උවමනාවකින් කටයුතු කරනු ලබන රාජ්‍ය නොවන සංවිධානවලට වැඩි අවස්ථාවක් ලබා දීමට හැකිවිය.

කාර්යාල පරිසරය හා භෞතික පහසුකම් වැඩි දියුණු කිරීම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය අවට අනවශ්‍ය දෑ ඉවත්කර පිරිසිදු කිරීම හා අලංකාරවත් ප්‍රියමනාපවත් පරිසරයක් පවත්වාගෙන යාමට සැලකිය යුතු වැඩපිළිවෙලක් හා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කල අතර පළමුව මහල් කිහිපයක පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ එක් මහලක් යටතට ගැනීම සහ පිහන් ගඩොල් ඇතිරීම, කෑමකාමරයක් සකස් කිරීම , තීන්ත ආලේප කිරීම , වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කර සකස් කිරීම, කාර්යාල ගොඩනැගිලි අභ්‍යන්තරයේ තීන්ත ආලේප කිරීම. කොරිඩෝවේ පිහන් ගාඩොල් ඇතිරීමද, වහලයේ වැහිපීලි පද්ධතිය නවීකරණය කිරීමද සිදු කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 10 ක් වැය කර ඇත. වර්තමානයේ බාහිර පරිසරය හොඳ මට්ටමක පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත .එසේ කාර්යාල පරිශ්‍රය අභ්‍යන්තරවද පිරිසිදුව ක්‍රමවත්ව හා මහජනතාවට ප්‍රසන්න ආකාරයෙන් හා දෘෂ්ඨීමය අවබෝධයක් ලබා ගත හැකි ආකාරයට සකස් කිරීමටත් කාර්යාල උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමටත් මේ සියල්ලම තුලින් ISO 2008-9001 මට්ටම තවදුරටත් පවත්වාගෙන යාමටත් පෙර වර්ෂයන්ට සාපේක්ෂව මෙම වර්ෂයේදී හොඳ වර්ධනයක් ඇති කර ගැනීමටත් හැකිවිය.

දිස්ත්‍රික් සංවර්ධනය හා පරිපාලනය සඳහා පිරිවැය

2012 වර්ෂය තුල සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා කැපි පෙනෙන ප්‍රමාණයක ප්‍රතිපාදන ලබාගැනිමටත් ඒවා නිසි පරිදි වියදම් කිරීමටත් ඒ තුලින් සංවර්ධන, පරිපාලන ඉලක්ක කරා සාර්ථකව ගමන් කිරීමටත් සමත් විය. එයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 සඳහා දරණ ලද වියදම් මෙහිදී දක්වන්නේ නම් විමධ්‍යගත අයවැය - මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු ගරු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 67ක් ද ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය මඟින් ව්‍යාපෘති 1084ක් සඳහා රුපියල් මිලියන 976ක් ද අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අරමුදල් රුපියල් මිලියන 131.31ක් ද ඊට අමතරව පල්ලේකැලේ බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 181.66 ක් ද ආයෝජනය කර ඇති අතර ද සමෘද්ධි අධිකාරි අරමුදල් රුපියල් මිලියන 49.6ක් ද අනෙකුත් සංස්ථා මණ්ඩල හා අධිකාරි අරමුදල් රුපියල් මිලියන 4637.84 ක් ද මහියංගන මාර්ගය සංවර්ධනය සඳහා කි.මී.7.8 කට රුපියල් මිලියන 5400 ක්ද පළාත් මාර්ග කාපට් කිරීම සඳහා රුපියල් මිලියන 3075ක් ද ප්‍රාථමික පාසල් 5000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ

පාසල් 58ක් සඳහා රුපියල් මිලියන 28.5ක් ආයෝජනය කරන ලදී. දිවිනැගුම වැඩසටහන් යටතේ කෘෂි , සත්ත්ව නිෂ්පාදන හා ස්වයං රැකියා සඳහා රුපියල් මිලියන 61ක ද්‍රව්‍ය හා උපකරණ පහසුකම් සපයා ඇත.

මීට අමතරව මහනුවර දිස්ත්‍රික්කයේ සංවර්ධන පරිපාලනය සඳහා නව ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා නිල නිවාස ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 64ක් වැය කළ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් සඳහා රුපියල් මිලියන 10 ක් වැය කෙරින. දිස්ත්‍රික් ලේකම් නිල නිවාස අලුත්වැඩියාව සඳහා රුපියල් මිලියන 3.3ක් ද ප්‍රාදේශිය ලේකම් නිල නිවාස පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 1.0 ක් ද ලෙස පසුගිය වසර තුල මහනුවර දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂය යටතේ දරා ඇති පුනරාවර්ථන වියදම් රුපියල් මිලියන 2461 ක් ද මූලධන වියදම් රුපියල් මිලියන 3299 ක් ද ලෙස දැක්විය හැකිය.

තිරසාර සංවර්ධන වැඩසටහන හා ගම නැගුම / දිවි නැගුම

විමධ්‍යගත අයවැය ජාතික සවිය හා ගම නැගුම යටතේ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය හා පළාත් සභා සංවර්ධන වැඩසටහන ඇතුළු සමස්ථ සංවර්ධන කටයුතුවල ඉහළ ප්‍රගතියක් අත්පත් කරගන්නට සමත්විනි . දිලිඳුකම පිටු දැකිමේ ප්‍රමුඛ වැඩසටහන ලෙස සමෘද්ධි වැඩසටහන දිස්ත්‍රික්කය තුල සාර්ථකව ක්‍රියාවට නැංවීමේ දී ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කරලීමට හේතුවන දිවි නැගුම වැඩසටහන ප්‍රමුඛත්වයේ ලා සළකා ක්‍රියා කරන ලදි .මෙම සියලු ක්‍රියාදාමයන්ගේ අරමුණ වුයේ ගම නැගුම/දිවි නැගුම තුලින් ජනතාව සුඛිත මුදිත කරලීමයි.

මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව

ජාත්‍යන්තර තත්ත්ව සහතික නිර්ණායක තුලින් අඛණ්ඩ ගුණාත්මක පරිපාලනයක් කරා ගමන් කරමින් රාජ්‍ය සේවයේ ඉහළ ඵලදායිතා වර්ධනයට හේතුවන දැනුම ආකල්ප වර්යාධර්ම හා ක්‍රමවේදයන් වර්ධනයට හා පුහුණුවට ප්‍රධාන තැනක් හිමිකර දෙන ලදි .කටුගස්තොට ස්ථාපිත කර ඇති "රාජ්‍ය සේවා පුහුණු ආයතන " හරහා සහ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා නිපුණතා ප්‍රවර්ධන ඒකකය මඟින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කල අතර රාජකාරි පරිසරය තුලදි මෙන්ම මානව සම්පත් සංවර්ධන විෂයෙහිදි ඒවා සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේදී ආකල්ප වර්ධනයට හා පුහුණුවට ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. ඵලදායිතා කව රැස්වීම් හරහා නිලධාරීන්ගේ දැනුම ආකල්ප වර්ධනයට වැඩසටහන් නිර්මාණය විය.

කාර්යක්ෂම හා ගුණාත්මක කාර්ය මණ්ඩලයක් කරා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය මඟින් කාර්යක්ෂම හා ගුණාත්මක මහජන සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය කරන ගුණාංගයන් රාශියක් ප්‍රගුණ කිරීමට හැකිවීම සතුටට කරුණකි .මේ සඳහා සමස්ත කාර්ය මණ්ඩලයේ ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන් පුහුණු වැඩසටහන් වැඩමුළු ආදර්ශයන් සැලකිය යුතු ප්‍රමාණයක් ලබාදීමෙන් එම නිලධාරින්ගේ දැනුම ,කුසලතා ,ආකල්ප ධනාත්මක තලයකට ගෙන ඒමට හැකිවිය .එසේම ඵලදායිතා කව හරහා කාර්ය මණ්ඩලයේ අදහස් යෝජනා, කුසලතා කාර්යාලයේ වැඩිදියුණුවට මෙන්ම ගුණාත්මක මහජන සේවාවකට හිතසුව පිණිස යොදා ගැනීම බලාපොරොත්තු සඵලවීමකි. ඊට සමගාමීව පරිගණක තාක්ෂණය භාවිතයෙන් ඊ-මේල්, ඉන්ටර්නෙට් වෙබ් අඩවි යනාදියත් සමඟ ISO 9001 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ලිපි ගොනු කටයුතු හා අනෙකුත් දෛනික සේවා කටයුතු හැඩගස්වා ගැනීමෙනුත් මහජන ප්‍රසාදයට පාත්‍ර වූ කාර්ය මණ්ඩලයක් දක්වා වර්ධනය කර ගැනීමට හැකිවීම දිස්ත්‍රික් පරිපාලනය ලැබූ ජයග්‍රහණයකි.

දිනාගත් ජයග්‍රහණයන්

2012 වර්ෂයේදී 2011 වර්ෂයට සාපේක්ෂව තවදුරටත් වැඩිදියුණු කරගත් කාර්ය සාධන මට්ටමක් කරා ලගාවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වලටද හැකිවීම සතුටට කරුණකි. එයට සමගාමීව ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පැවැත් වූ ඵලදායිතා තරඟයෙන් 2010,

2011 ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර ජාතික මට්ටමේ තරඟයෙන් මැදදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ප්‍රථම ස්ථානය හිමි වීමද දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රථම ස්ථානය දිනා ගැනීමත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 න් 17ක් තරඟය සඳහා ඉදිරිපත් වූ අතර ඉන් 16ක් කුමන මට්ටමේ හෝ ජයග්‍රහනයක් ලබා ගැනීමට සමත් වීම සුවිශේෂ තත්වයක් මෙන්ම යහපත් කාර්යසාධන මට්ටමක් දිස්ත්‍රික් පරිපාලනය තුල තිබූ බවට හොඳ සාක්ෂියකි.

එසේම ISO 9001තත්ව සහතිකය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලබා ගෙන පවත්වාගෙන යාමෙන් පසු අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක් ISO 9001තත්ව සහතිකය අත්කර ගැනීමත් සිදුවිය.මේ සියලු ජයග්‍රහනයන් දේශපාලන නායකත්වයෙන් හා විවිධ ආයතන, සංවිධාන මෙන්ම ප්‍රජාවගේද නොමද ඇගයීමට ලක්විය . මෙම සියලු කර්තව්‍යයන් තුලින් කාර්යක්ෂම හා ගුණාත්මක සුභදශීලි මහජන සේවයක් දිස්ත්‍රික්කයේ මහජනතාව වෙත ලබාදීමට හැකිවීම අපගේ මෙහෙවර සාධනය කරා ගමන් කිරීමකි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය එකම කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් පැහැදිලි දර්ශනයක් යටතේ ක්‍රියාත්මක සැලැස්මක් තුළ ඵලදායිතා කව ක්‍රියාත්මක කිරීම තුළින් නිරන්තර ප්‍රගතිය පරික්ෂා කරමින් මෙම මට්ටම පවත්වා ගැනීමට හැකි විය .මෙම කාර්ය සාධන මට්ටම පවත්වා ගැනිම සඳහා සමස්ත කාර්ය මණ්ඩලයම ඒකාබද්ධව කටයුතු කරනු ලැබීමෙන් මෙම ප්‍රතිඵල අත් කර ගැනීමට හැකිවූ බව මම විශ්වාස කරන අතර ඒ සඳහා සමස්ත කාර්ය මණ්ඩලය කැප කිරීම් කරමින් කරන ලද සේවාව ඉතා අගේ කොට සලකමි.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
මහනුවර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති

2013 පෙබරවාරි මස 07 වැනි දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

1815 මාර්තු දෙවෙනිදා අත්සන් කළ කන්ද උඩරට ගිවිසුමත් සමග ලංකාවේ ස්වෛරී බව අහෝසි වී බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්විය. ඒ සමගම මෙතෙක් පැවැති රජු මුල්කොටගත් දේශීය රාජ්‍ය පරිපාලන ව්‍යුහය බිඳවැටුණි.

ඒ අනුව බ්‍රිතාන්‍ය යුගයේ මධ්‍යම පළාතේම ප්‍රධාන පරිපාලන නිලධාරියා මහනුවර කච්චේරියේ දිසාපතිවරයා විය. ඉතිහාසගත තොරතුරු මුලාශ්‍රවලට අනුව මහනුවර කච්චේරිය ක්‍රි.ව. 1825 දී මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන ප්‍රථමයෙන්ම ආරම්භ කොට ඇත. මහනුවර ප්‍රථම දිසාපතිවරයා ලෙස සුදු ජාතික ජෝර්ජ් ටර්නර් මහතා කටයුතු කොට ඇති අතර හෙතෙම 1825 සිට 1827 දක්වා මහනුවර මහ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත.

මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන පවත්වාගෙන යනු ලැබූ මහනුවර කච්චේරිය 1868 දී ශ්‍රී දළදා මාලිගාවේ පත්තිරිප්පුව වෙත රැගෙන ගොස් ඇති බවටද, තොරතුරු හමුවෙයි. එවකට මහනුවර සමයේ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ පී.ඩබ්.බේබුක් මහතාය.

මීට අමතරව විවිධ හේතූන් මත මහනුවර කච්චේරිය මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන ගොස් ඇත. 1880 දී ශ්‍රී දළදා මාළිගාවය සමීපව ඉදිකළ කච්චේරි ගොඩනැගිල්ලට (පසුකාලීනව උසාවි ගොඩනැගිල්ල ලෙස හඳුන්වන ලද) මහනුවර කච්චේරිය ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයාව කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ එෆ්.බී. ටෙම්ප්ලර් මහතාය. එවක් පටන් අවුරුදු 80ක් පමණ කච්චේරියේ කටයුතු අඛණ්ඩව සිදු වී ඇත්තේ එම ස්ථානයේය.

1957 වර්ෂයේදී එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කළ ඒ.බී.එස්.එන්.පුල්ලෙයාර් මහතාගේ කාලයේදී මහනුවර කච්චේරිය දැනට යටිනුවර විදියේ පවත්නා ගොඩනැගිල්ලට ගෙන ගොස් ඇත.

1825 සිට 2006 වන විට මහනුවර දිසාපතිවරුන් 37 දෙනෙකු යටතේ පාලනය වී ඇති අතර, පළමු දිසාපතිවරයා ලෙස ජෝර්ජ් ටර්නර් මහතාගෙන් පටන්ගෙන ඊ.ජේ. ඩයිසන් දිසාපතිවරයා දක්වා සුදු ජාතික දිසාපතිවරු 20 දෙනෙකුද, ආර්.අළුවිහාරේ දිසාපතිවරයාගෙන් (1946) පටන් ගෙන එච්.එම්.ගාමිණී සෙනවිරත්න මහතා දක්වා දේශීය පරිපාලන නිලධාරීන් 18 දෙනෙකු දිසාපතිවරු වශයෙන් කටයුතු කොට තිබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර ගොඩනැගිල්ල තුල මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් පාලන ආයතනය, මෝටර් රථ දෙපාර්තමේන්තුව හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද පිහිටා තිබීම විශේෂ තත්වයකි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන සියළුම අංශවල කාර්ය මණ්ඩලය 241 දෙනෙකු වේ.

2.1 දර්ශනය හා මෙහෙවර

තත්ත්ව ප්‍රතිපත්තිය

“ISO 9001; 2008 ජාත්‍යන්තර සේවා ප්‍රමිතීන් අනුව අඛණ්ඩව වැඩි දියුණු වන යහපාලිත කළමනාකරණ පද්ධතියක් තුලින් සේවාලාභීන් වෙත උපරිම පාරිභෝගික තෘප්තියක් අත්කරදීම”

2.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අරමුණු ඉටු කිරීමට කරනු ලබන ප්‍රධාන කාර්යයන්

- අපගේ අරමුණු දිනා ගැනීම සඳහා නිරන්තරයෙන් උරදෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ආයතන කටයුතු කාර්යක්ෂමව ඉටු කර දීමෙන් ඔවුන් තුළ යහපත් මානසික වාතාවරණයක් ඇති කිරීම.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා එම නිලධාරීන්ගේ ආයතන කටයුතු (නිළධාරීන්ගේ සේවය ස්ථීර කිරීම්, කඩඉම් පරීක්ෂණ පැවැත්වීම, උසස් වීම්/සේවය දීර්ඝ කිරීම් හා නිළධාරීන්ට වැටුප් ණය අත්තිකාරම් ලබා දීම් වැනි ආයතනික පහසුකම් සැලසීම)

- දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති වසම් 1188 ක ග්‍රාම නිලධාරීන්ට අදාළ වූ ආයතන රාජකාරී ඉටු කිරීමෙන් ඔවුන් තුළ යහපත් මානසික තෘප්තියක් ඇති කිරීම.

- ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මාළිගාව ප්‍රමුඛ මල්වතු අස්ගිරි මහා විහාර සහ ශ්‍රී දළදා පෙරහැර ඇතුළු ආගමික කටයුතු

- හින්දු මුස්ලිම් හා අනෙකුත් ආගම් වලට අදාළ කටයුතු

- දිස්ත්‍රික් කෘෂිකර්ම සම්බන්ධීකරණ කමිටුව/දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීම කමිටු/ දිස්ත්‍රික් ආරක්ෂක යනාදී කමිටු පැවැත්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සියළු රැස්වීම් පැවැත්වීමට සහාය වීමෙන් අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වීම හා එමගින් ජනතා අපේක්ෂා ඉටු කිරීම.

- ජලය, විදුලිය, යටිතල පහසුකම් ඇතුළු සංවර්ධන කටයුතු හා ආර්ථික සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සමඟ දිස්ත්‍රික් ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වනු ලබන උත්සව සංවිධානය කර සාර්ථකව පැවැත්වීම.

- මැතිවරණ දෙපාර්තුමේන්තුව හා සම්බන්ධීකරණය වීම.

- නවක කාර්යය මණ්ඩල පුහුණු කිරීම හා සේවා නියුක්ත කාර්යය මණ්ඩලයේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම උදෙසා ඔවුන් පුහුණු පාඨමාලා සඳහා යොමු කරවීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල යහපත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩල මඟින් පරීක්ෂා කරවීම හා වැරදි නිවැරදි කිරීමට උපදෙස් ලබා දීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණයේ පවතින ක්‍රමසම්පාදන, කුඩා ව්‍යාපාර, පාරිභෝගික අධිකාරිය මිනුම් හා ප්‍රමිති ඒකක අංශය සමාජ ආරක්ෂණ අංශය, දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය, සංඛ්‍යා ලේඛණ අංශය, දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලය, දිස්ත්‍රික් සමෘද්ධිකාර්යාලය,මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුව, සංස්කෘතික දෙපාර්තුමේන්තුව, ආපදා කළමනාකරණ කටයුතු, මැතිවරණ දෙපාර්තුමේන්තුව යන කාර්යාල සම්බන්ධීකරණ කටයුතු සහ අධීක්ෂණය විවිධ දෙපාර්තුමේන්තු වලින් අනුයුක්ත කර ඇති රාජ්‍ය සේවයට අළුතින් බඳවා ගත් උපාධිධාරීන් ගේ ආයතන කටයුතු පවත්වාගෙන යාම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අවශ්‍ය වන්නා වූ මුද්‍රිත ආකෘති පත්‍ර හා පොත් පත් තොග පවත්වාගෙන යාම තුළින් විධිමත් ලෙස බෙදා හැරීම.

- මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක් ගැනවිලි, ඉල්ලීම් යනාදිය සම්බන්ධව අදාළ අංශ වෙත යොමු කිරීම සහ නිසි මග පෙන්වීම තුළින් යහපත් සේවාවක් ඉටු කිරීම.

- දිස්ත්‍රික් පරිපාලනයට හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ නිළධාරීන් සම්බන්ධව ලැබෙන පෙත්සම්, පැමිණිලි සම්බන්ධව අපක්ෂපාති පරීක්ෂණ පැවැත්වීම තුළින් යහපත් පාලනයක් ඇති කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ කොස්/දෙල් ගස් හෙළීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම අනුමත කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම සහ වාර්ෂිකව ගිනි අවි 1500 කට ආසන්න ප්‍රමාණයකට බලපත්‍ර ලබා දීම.

- දිස්ත්‍රික්කය තුළ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම හා ආරක්ෂණ සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

- මහලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල නඩත්තු කිරීම, ජල විදුලි හා අභ්‍යන්තර දුරකතන පහසුකම් සැලසීම තුළින් මහජන සේවා සැපයීමට යටිතල පහසුකම් සැලසීම.

- රජයේ නිල නිවාස 47 විධිමත් පරිදි වෙන් කිරීම හා නඩත්තු කිරීම.

- රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනක ක්‍රියාත්මක කිරීම හා නිසි කළමනාකාරීත්වය තුළින් ඒහා සම්බන්ධ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම.

3. මහනුවර දිස්ත්‍රික්කය - හැදින්වීම

මනහර කඳුවැටි හා නිම්න භූමි වලින් සැදුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.

උතුරින් මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල, රත්තොට ලග්ගල-පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගණය ප්‍රා.ලේ කොට්ඨාශයෙන් ද, දකුණින් බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය හා අඹගමුව කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක, බුලත්කොහුපිටිය, මාවනැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් මායිම් වී පවතින මහනුවර දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 60.56 ත් 70.29 හා නැගෙනහිර දේශාංශ 80.25 ත් 80.0 අතර පිහිටා ඇත.

මහවැලි ගංගාවට දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලින් ගලා එන ජලධාරාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් එක් වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජල ධාරා ආරම්භවන්නේද සූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ජල ධාරාව වැඩි කරයි.

මධ්‍යම පළාතේ දිස්ත්‍රික්කයන් වන මහනුවර මාතලේ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් තුනෙන් ප්‍රධාන දිස්ත්‍රික්කය වන මෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක්ද ප්‍රාදේශිය සභා 17ක්ද ග්‍රාම නිලධාරි කොට්ඨාස 1187කින් ද සමන්විත වන්නේය. 2011 ජන හා නිවාස සංගණනය අනුව මහනුවර දිස්ත්‍රික් ජනගහනය 1,369,899ක් වේ .එයින් 74.34% ක් සිංහලද, 11.31%ක් ද්‍රවිඩ ද, 13.95%ක් මුස්ලිම් ද, 0.40% ක් වෙනත් ජාතීන් ද වේ. සාමාන්‍යයෙන් කන්ද උඩරට ජනතාවගේ විශේෂ සමාජයීය ගති ලක්ෂණයක් ලෙස ආගන්තුක සත්කාරයට රුචිකත්වයක් දක්වන පිරිසක් වෙසෙන බව සමාජ විද්‍යාඥයින්ගේ මතයක් වේ.

ඓතිහාසික පසුබිම

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර, අනුරාධපුර, පොළොන්නරු යුගයන් වලදී මලය රට ප්‍රදේශයට අයත්ව තිබූ අතර ගම්පොල රජ කල තුන්වන වික්‍රමබාහු රජ දවස නගරයක් වශයෙන් දියුණු කළ බව ජනප්‍රවාදයේ දැක්වේ. සෙංකඩගල නුවර නමින් එදා හැඳින් වූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජතුමා විසින් සිංහල රාජධානියේ අග නගරය ලෙස යොදා ගනිමින් අලංකාර දළදා මන්දිරයක්, රජ මාළිගයක් ඇතුළු සියළුම අංග වලින් සම්පූර්ණ නගරයක් බවට පත් කරන ලදි. එතැන් සිට සියවස් තුනක පමණ කාලයක් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර බලවත් ජාතීන්ගේ නිර්මල බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් 1815 මාර්තු 02 වන දින දක්වා සිංහල රාජධානියේ අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය නොසැලී පැවතුනි. මුහුදු බඩ පළාත් බටහිර ජාතීන් පාලනය කළ යුගයේ දී ඔවුන් විසින් මහනුවර රාජධානියට වරින් වර එල්ල කෙරුන ආක්‍රමණයන්ට එරෙහිව සිදු වූ ජයග්‍රාහී සටන් බොහෝමයක් මහනුවර ආශ්‍රිතව සිදු විය. දෙවන රාජසිංහ රජ සමයේ පේරාදෙණිය, ගන්නොරුවේ දී සහ යටිනුවර දන්තුරේ දී සිදු වූ සටන් වලින් ආක්‍රමණික විදේශ හමුදා සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. විදේශිකයන්ගෙන් සිංහල රාජධානිය රැක ගැනීමට පිහිට වූ ප්‍රධාන බල කොටුවක් වන බලන කොටුව වර්තමාන කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

1815 දී විවිධ දේශපාලන අර්බුද නිසා මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වූ පසු අවසන් සිංහල රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම වසරේ පෙබරවාරි 15 වන දින මැදමහනුවර බෝමුරේ ගම්මානයේ දී ඉංග්‍රීසීන් විසින් අල්ලා ගන්නා ලදි. 1815 මාර්තු 02 වන දින මහනුවර මහුල් මඩුවේ දී අත්සන් තැබුණු උඩරට ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවේ පාලනය ඉංග්‍රීසීන් අතට පත් වූ අතර ඔවුන් විසින් රටේ අග නගරය ලෙස කොළඹ භාවිතා කරන තෙක්ම රටේ ප්‍රධාන නගරය ලෙස සැලකුනේ මහනුවරයි.

සිංහල ඉතිහාසයේ අවසන් නිදහස් සටන වන 1818 දී ඌව - වෙල්ලස්ස කැරැල්ල වෙනුවෙන් මහනුවර ප්‍රෙදේශයේ රදළ නායකයින් විශාල පිරිසක් නායකත්වය දී ඇත. සිය තනතුරු පසෙකලා නිදහස් සටන වෙනුවෙන් කැපවුනු මොණරවිල කැප්පෙටිපොළ, මඩුගල්ල ආදී නායකයන් බොහෝ දෙනෙකුගේ නිජ බිම වී ඇත්තේ මහනුවර ප්‍රදේශයයි. 1818 නිදහස් අරගලය කෲර ලෙස මැඩපැවැත් වූ ඉංග්‍රීසීන් විසින් මහනුවර ප්‍රදේශය ඇතුළු කඳුකරය වැවිලි කර්මාන්තය හා වෙළඳාම මත පදනම් වුනු ආර්ථික රටාවක් කරා ගෙන යන ලදි.

වැවිලි ආර්ථිකය යටතේ මුලින්ම හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයක් නිසා විනාශ වූ පසු දිවයිනේ සිටුවන ලද පළමු තේ ගස දෙල්තොට ප්‍රාදේශය ලේකම් කොට්ඨාශයේ ලුලුකඳුර වතු යායේ අදත් දක්නට ඇත.

ඓතිහාසික ස්ථාන

මුළු මහත් ලෝකයේම බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දළදා මාළිගාව මහනුවර නගරයේ පිහිටා ඇති අතර ඓතිහාසික වශයෙන් වැදගත් වූ සිද්ධස්ථාන විශල ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

1.ගඩලාදෙණිය විහාරය
2.ඇම්බැක්ක දේවාලය
3.දෙගල්දොරුව රජමහා විහාරය
4.ගල්මඩුව රජමහා විහාරය
5.තලාව රජ මහා විහාරය
6.මැදමහනුවර බෝමුරේ ගම්මානය හා රජගල කන්ද ඒ අතර වේ.

දේශගුණික හා පාරිසරික ලක්ෂණ

ප්‍රධාන වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 100 -1600 ත් අතර උසකින් යුත් මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය මහවැලි ගඟට මායිම්ව මුහුදු මට්ටමේ සිට මීටර් 100 ක පමණ උසින් යුතු තැනිතලා ස්වාභාවයක් ගනී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1840 අගයක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කඳුකර හා පහත රට වියළි කලාපීය දේශගුණික ලක්ෂණයන් සහිතය. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-22 අතර අගයක් ගන්නා අතර වසර පුරාම සෞම්‍ය දේශගුණයක් දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක පවතී. සාමාන්‍යයන් දෙල්තොට, පස්බාගේ කෝරළේ, ගඟ ඉහළ කෝරළේ, උඩදුම්බර, පන්විල ආදී ප්‍රදේශවලට සාපේක්ෂව අඩු අගයක් ගන්නා අතර ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ පිහිටා ඇති මිනිපේ ප්‍රදේශය සාපේක්ෂව වැඩි උෂ්ණත්වයකින් යුක්තය.

මහවැලි ගංගාව දිස්ත්‍රික්කය මැදින් ගලා යන ප්‍රධාන ගංගාව වන අතර එය මුළු දුරෙන් ආසන්න වශයෙන් කි.මී 110 ක දුරක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ගලා බසී. මහවැලි ගංගාවේ ආරම්භක ජල ධාරා වන හැටන් ගඟ සහ කොත්මලේ ඔය එක් වී මහවැලි ගංගාව නමින් ගලා බැසීම පටන් ගන්නේ ද පස්බාගේ පොල් වතුර නම් ග්‍රාමයේ දී ය. මෙසේ ගලා යන මහවැලි කලාපයක් වේ. එහි ප්‍රධාන කඳු ශිඛරය වන කොබෝනීල ගල,(උස මීටර් 1553.87), දෝතළුගල (උස මීටර් 1642.57) ආදි කඳුවැටිය දිස්ත්‍රික්කය තුළ

පිහිටා ඇත.සාමාන්‍ය වර්ෂාපතනය ඉහළ අගයක් ගන්නා මෙම කලාපය මහවැලි ගඟේ සහ අඹන් ගඟේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වේ. ශ්‍රී ලංකාවට ආවේනික ශාක සහ සත්ත්ව ප්‍රජාවට රැකවරණය සලසන නකල්ස් කඳුවැටිය දිස්ත්‍රික්කයේ ස්වභාව සෞන්දර්යය අතින් ඉහළම තැනක් ගන්නා ප්‍රදේශයකි.

හන්තාන කඳු වැටිය, අම්බුළුවාව කන්ද, බලන කඳුවැටිය, අලගල්ල කන්ද වැනි කඳු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර කඩියන්ලෙන, ගලබොඩ ආදී සුන්දර දිය ඇළි විශාල ප්‍රමාණයක් ද මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මේ දිය ඇළි වලින් විශාල ප්‍රමාණයක් අප්‍රකටව පවතින මුත් සුන්දරත්වය අතින් ඉහළ අගයක් ගනී.

ස්වාභාවික වෘක්ෂලතා

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 41,521 ක් වනාන්තර වශයෙන් පවතී. මෙම භූමි ප්‍රමාණය මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 21 කි. දැඩි රක්ෂිතයන් ලෙස රැක ගත යුතු මෙම වනාන්තර වලින් හෙක්ටෙයාර් 23,317 භූමි ප්‍රමාණයක් සඟ වනාන්තර වශයෙන් ද හෙක්ටෙයාර් 10,759 ක් විවෘතවනාන්තර සහ හෙක්ටෙයාර් 7,445 ක ප්‍රමාණයක් වන වගා ලෙස ද පවතී.උස් කඳු මුදුන් ආශ්‍රිතව ද වැඩි වන ගහනයක් දක්නට ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජල උල්පත් වල ආරක්ෂාවට මෙම වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම දැඩි අවශ්‍යතාවක් වන අතර විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙහි පැවැත්මට තර්ජන එල්ලවන අවස්ථා ඇත.

නකල්ස් රක්ෂිතයට අයත් වන විශාල භූමි ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ. ශ්‍රී ලංකාවට ආවේනික ශාක හා සත්ත්ව වර්ග කීපයකට වාසභූමිය වන මෙම කලාපය දැඩි ස්වාභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇති ප්‍රදේශයේ විශාල භූමි ප්‍රමාණයක් ද මෙම දිස්ත්‍රික්කයට අයත් වේ. හන්තාන කඳුවැටිය හා උඩවත්ත කැලේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇති අතර මින් හන්තාන කඳුවැටිය හා උඩවත්ත කැලේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇති අතර මින් හන්තාන කඳුවැටිය දැඩි පාරිසරික තර්ජනයකට ලක් වූ ප්‍රදේශයකි.

වන සතුන්

මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ආශ්‍රිතව විශාල වන සත්ත්ව ප්‍රජාවක් ජීවත් වන අතර අලියා, දිවියා, වඳුරා, වල් ඌරා, කොළ දිවියා, මුවා, වැලි මුවා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

උඩදුම්බර , මිනිපේ යන ප්‍රදේශ වල වල් අලින් දක්නට ඇති අතර රන්දෙණිගල අභය භූමිය හා උඩදුම්බර මීමුරේ ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් වල් අලි සැරිසරයි. මෙම ප්‍රදේශ වල විශාල ලෙස පැතිරුණු වන ගහණය තුල දිවියන් ද ජීවත් වන අතර ගම්පොළ, හන්තාන, පාතහේවාහැට යන ප්‍රදේශවලින් ද දිවියන් පිළිබඳ විටින් විට වාර්තා වේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම කැලෑ ආශ්‍රිතව වඳුරන්, රිලවුන් සහ වල් ඌරන් ජීවත් වන අතර රන්දෙණිගල අභය භූමිය ආශ්‍රිතව තිත් මුවන් ගෝණුන් සහ වැලි මුවන් වැනි සත්ත්ව විශේෂ දක්නට ඇත. මීට අමතරව පක්ෂි විශේෂ විශාල ප්‍රමාණයක් ද ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වේ.

වන සතුන්ගෙන් ඇති වන ගැටළු

කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හා ජන ජීවිතයට වන සතුන්ගෙන් එල්ල වන බලපෑම් දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ඉහළ මට්ටමක පවතී. උඩදුම්බර, මිනිපේ සහ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඇතැම් ප්‍රදේශයන්හි ගම් වදින වල් අලි නිසා කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම මිනිස් ජීවිත වලටද තර්ජනයක් එල්ල වන අවස්ථා පවතී. උඩදුම්බර ප්‍රදේශයේ මීමුරේ ප්‍රාදේශීය හා කොට්ටඨාශයේ දකුණින් පිහිටි දේවහන්දිය, මඩුගල්ල හා මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහපැලැස්ස, හඳගනාව, උඩගලදෙබොක්ක, ගලමුදුන ආදී ප්‍රදේශ වලට මෙම ගැටළුව දැඩි ලෙස බලපායි.

රිලවුන් සහ වල් ඌරන්ගෙන් වගාවට සිදුවන හානි දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම පාහේ දක්නට ඇති අතර මෙය පාලනය කිරීමට අපහසු ගැටළුවක් බවට පත් වෙමින් තිබේ.

ජීවන රටාව

මහනුවර දිස්ත්‍රික්කයේ පවත්නා සාමකාමී හා යහපත් ආර්ථික වාතාවරණය දිස්ත්‍රක්කයේ වෙසෙන ජනතාවට ඉතා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇත. එකම භූමි ප්‍රදේශයක් තුළ විවිධ ජනවර්ග ඉතා සහජීවනයෙන් යුතුව වාසය කරනු දක්නට ලැබේ. 80.5% ජනතාවක් වාසය කරන ග්‍රාමීය ප්‍රදේශවල පැරණි ජීවන රටාවක් අනුගමනය කරන කෘෂිකාර්මික දිවි පැවැත්මක් සහිත ජනතාවක් වාසය කරයි. එහෙත් 12.2% ක් වාසය කරන නාගරික ප්‍රදේශවල අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන අතර ඔවුන් කර්මාන්ත හා සේවා කෙෂ්ත්‍ර යටතේ තම ජීවන වෘත්තීන් වලට දැඩිව නැඹුරු වී ඇත. කෙසේ වුවද 7.5% ක් වන වතු ජනතාව වැවිලි කෙෂ්ත්‍රයට අදාළ ජීවනෝපායන් වල නියුක්තව සිටී. මෙම කෙෂ්ත්‍ර තුනෙන් දිස්ත්‍රික් ආර්ථිකයට දක්වන දායකත්වය සුවිශේෂී වැදගත්කමක් ගනී.

3. 1 පරිපාලන සිතියම



3.2 මූලික තොරතුරු

මූලික තොරතුරු

❖ වර්ග ප්‍රමාණය (ව.කි.මී)	1940
❖ පළාත	මධ්‍යම
❖ දිස්ත්‍රික්කය	මහනුවර
❖ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන	20
❖ ග්‍රාම නිලධාරී කොට්ඨාස	1188
❖ ගම් හා ජනපද	2758
❖ මැතිවරණ කොට්ඨාස ගණන	13
❖ මහනගර සභා	01
❖ නගර සභා	04
❖ ප්‍රාදේශීය සභා	17
❖ අධ්‍යාපන කලාප	06
❖ පාසැල් සංඛ්‍යාව	642
❖ ගුරුවරු සංඛ්‍යාව	15,767
❖ ශිෂ්‍ය සංඛ්‍යාව	269,771
❖ ශිෂ්‍ය ගුරු අනුපාතය	17.1%
❖ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව	12
❖ පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව	28
❖ පළාත් පාලන ආයතන නියෝජිතයන්	328
❖ රා.ප.අමාත්‍යාංශය යටතේ වන සංචාරක නිල නිවාස	01
❖ පූජ්‍ය පක්ෂය	3,027
බෞද්ධ	44
හින්දු	301
ඉස්ලාම්	283
රෝමානු කතෝලික	45
❖ ජනගහනය	
2011 ජන හා නිවාස සංගණනය	1,369,899
❖ නිවාස සංඛ්‍යාව	342,255
❖ පවුල් සංඛ්‍යාව	344,681

මූලය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර
සැකසුම:- දිස්ත්‍රික් මෙහෙයුම් ඒකකය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

4. සංවිධාන ව්‍යුහය



4.1 අනුමත කාර්ය මණ්ඩලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

තනතුරු නාමය	කළමනාකරණ සේවා චක්‍ර ලේඛය අනුව අනුමත කාර්ය මණ්ඩලය	සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
A කාණ්ඩය			
දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී.ල.ප.සේ) 01	01	01	
B කාණ්ඩය			
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී.ල.ප.සේ)	01	01	
සහකාර දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී.ල.ප.සේ)	01	01	
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ල.ග.සේ)	01	01	
ගණකාධිකාරි (ශ්‍රී.ල.ග.සේ)	01	01	
දිස්ත්‍රික් ඉංජිනේරු (ශ්‍රී.ල.ඉ.සේ)	01	01	
පරිපාලන නිලධාරි	01	01	
C කාණ්ඩය			
භාෂා පරිවර්තක	02	02	
සංවර්ධන සම්බන්ධීකාරක	02	02	
අයවැය සහකාර	02	02	
කළමණාකරන සහකාර සේවය	24	24	
කාර්මික නිලධාරි	01	01	
සැලසුම් ශිල්පි	01	01	
දත්ත සටහන් ක්‍රියාකරු (පරිගණක)	02	02	
පිළිගැනීමේ නිලධාරි	01	01	
D කාණ්ඩය			
රියදුරු	06	06	
පොත් බඳින්නා (කා.සේ..සේ 1)	01	01	
සංචාරක නිවාස භාරකරු	02	02	
කාර්යාල සේවක සේවය (කා.සේ..සේ 11)	12	12	
දුරකථන ක්‍රියාකරු (කා.සේ..සේ 1)	01	01	
මුරකරු (කා.සේ..සේ 11)	02	02	
කාර්යාල කම්කරු (කා.සේ..සේ111)	01	01	
උද්‍යාන කම්කරු (කා.සේ..සේ111)	01	01	
සනිපාරක්ෂ කම්කරු (කා.සේ..සේ 111)	02	02	
එකතුව	70	70	

4.2 අංශ අනුව කාර්ය මණ්ඩලය

අංශය	තනතුර/සේවය	සේවක සංඛ්‍යාව	දුරකථන
	දිසාපති /දිස්ත්‍රික් ලේකම් එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා **අතිරේක දිස්ත්‍රික් ලේකම්** සුනන්ද කාරියප්පෙරුම මහතා **සහකාර දිස්ත්‍රික් ලේකම්** මොහාන් ධර්මදාස මහතා		0812222235 0812239241 0812239129
1. ආයතන අංශය	**1.පරිපාලන නිලධාරි** - ආර්.ඒ. අජිත් කුමාර මහතා 2.කළමනාකරණ සහකාර සේවය 3.පරිගණක දත්ත ක්‍රියාකරු 4.වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා 5.පිළිගැනීමේ නිලධාරි 6.කාර්යාල කාර්යය සහයක 7.රියදුරු 8.මුරකරු	01 10 01 02 01 05 06 02	0812224435
2. ගිණුම් අංශය	1.ප්‍රධාන ගණකාධිකාරි ඩබ්.එම්.විජේරත්න මහතා 2.ගණකාධිකාරි ජේ.එම්.එස්. බණ්ඩාර මහතා 3.අය වැය සහකාර 4.විශ්‍රාම වැටුප් නිලධාරි 5.කළමනාකරණ සහකාර සේවය 6.පරිගණක දත්ත ක්‍රියාකරු 7.කාර්යාල කාර්යය සහායක	01 01 02 01 07 01 02	0812233604
3. දිස්ත්‍රික් ඉංජිනේරු අංශය	1.දිස්ත්‍රික් ඉංජිනේරු 2.කාර්මික නිලධාරි 3.සැලසුම් ශිල්පී	01 01 02	0815626672
4. සංවර්ධන හා පුනුණ අංශය	1.සංවර්ධන සම්බන්ධීකාරක 2. කළමනාකරණ සහකාර සේවය 3. භාෂා පරිවර්ථක 4. වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා 5. කාර්යාල සේවක සේවය	02 03 02 01 01	0812229129
5. අභ්‍යන්තර විගණන අංශය	අභ්‍යන්තර විගණන නිලධාරි	02	0812239241
7. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය	1.අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) පී. මුදලිගේ මහතා 2. නියෝජ්‍ය අධ්‍යක්ෂ 3. සහකාර අධ්‍යක්ෂ 4.) සංවර්ධන නිලධාරි 5. සංවර්ධන සහකාර 6.සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර 7. සංවර්ධන සහකාර(රාජ්‍ය නොසං.) 5. සංවර්ධන නිලධාරි උපාධිධාරි පුහුණු 9. කළමනාකරණ සහකාර සේවය 10.වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා 11.රියදුරු 12. කාර්යාල කාර්ය සහයක සේවය	01 01 02 03 03 04 03 04 02 01 01	0812224079 0812201120
8. දිස්ත්‍රික් සමෘද්ධි අංශය	1.සහකාර සමෘද්ධි කොමසාරිස් 2.දිස්ත්‍රික් සම්බන්ධීකරන නිලධාරි 3.කළමනාකරණ සහකාර 4.ප්‍රවර්ධන නිලධාරි 5.සමෘද්ධි කළමනාකරුවන් 6.සංවර්ධන නිලධාරි 7.සමෘද්ධි ලිපිකරු 8. සමෘද්ධි කා.කා.ස 9.රියදුරු **<u>සමෘද්ධි විගණන අංශය</u>** 1.විගණන කළමනාකරු 2.අභ්‍යන්තර විගණන නිලධාරී	01 01 02 02 09 12 03 01 01 03 08	0812223603 0812233809

9.සංඛ්‍යා ලේඛන අංශය	1.තියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යා ලේඛන) 2. සංඛ්‍යා ලේඛන නිලධාරි 3.දත්ත සටහන් ක්‍රියාකරු 4.කළමනාකරණ සහකාර සේවය 5. කාර්යාල කාර්යය සහයක 6. රියදුරු	01 03 04 01 01	0812223757
11.සංස්කෘතික හා ආගමික කටයුතු	1.සංස්කෘතික නිලධාරි 2.සංස්කෘතික සංවර්ධන සහකාර 3.බෞද්ධ කටයුතු සමායෝජක	02 01 01	0812239241
12.මාධ්‍ය අංශය	1.දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරි 2.මාධ්‍ය විමර්ශන නිලධාරි 3.ව්‍යාපෘති සහකාර	01 01 01	0812200149
13.පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ අංශය	1.මාණ්ඩලික සහකාර 2.කළමනාකරණ සහකාර 3.කාර්යාල කාර්ය සහයක	01 02 01	0812234752
14.මෝටර් රථ අංශය	1.මෝටර් රථ පරීක්ෂක 2.කළමනාකරණ සහකාර 3.සංවර්ධන හා විමර්ශන නිලධාරි 4.විමර්ශන සහකාර 5.සංවර්ධන සහකාර	03 03 02 03 02	0812237968
15.සමාජ සේවා අංශය	1.මූලස්ථාන සමාජ සේවා නිලධාරි	01	0812203929
16.සමාජ ආරක්ෂණ අංශය	1.දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි I 2.දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි II 3.රාජ්‍ය කළමණාකරණ සහකාර 4.කාර්යාල කාර්ය සහයක	01 02 01 01	0812228387
17.ආපදා කළමනාකරණ අංශය	1.දිස්ත්‍රික් සම්බන්ධීකාරක 2.සම්බන්ධීකරණ සහකාර 3.රියදුරු	01 04 01	0812202697
18.ළමා රක්ෂණ අංශය	1.සහකාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක 2. සහකාර දිස්ත්‍රික් මනෝ සමායෝජක	01 01	0812203929
19.පාරිභෝගික කටයුතු පිළිබඳ අංශය	1.දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි 2.විමර්ශන නිලධාරි	01 07	0602826212
20.මිණුම් ඒකක හා ප්‍රමිත සේවා අංශය	1.කාර්ය භාර නිලධාරි 2.පරීක්ෂක නිලධාරි 3.සහයක වරුන්	01 03 04	-
21.කෘෂිකර්ම අංශය	1. අධ්‍යක්ෂ (කෘෂිකර්ම) 2. සහකාර අධ්‍යක්ෂ (පොහොර ලේකම්)	01 01	0602826212
22.ජාතික ඒකාබද්ධ අංශය	ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර	01	0812239241
23.කුඩා ව්‍යාපාර අංශය	1.සහකාර අධ්‍යක්ෂ(අධිසේවක) 2.ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු කිරීමේ නිලධාරි 3.වැඩ සටහන් සහකාර	01 03 01	0812229180
24.ආපදා සහන සේවා අංශය	සංවර්ධන සහකාර	01	
25.දිස්ත්‍රික් ක්‍රීඩා අංශය	දිස්ත්‍රික් ක්‍රීඩා සම්බන්ධීකරණ නිලධාරි හා පුහුණුකරුවන්	08	0815633190
26.මානව සම්පත් සංවර්ධනඅංශය	1.වෘත්තිය මාර්ගෝපදේශන නිලධාරි 2.මානව සම්පත් සංවර්ධන සහකාර	01 05	0812224678
27. පුපුරන ද්‍රව්‍ය අංශය	1.පුපුරණ ද්‍රව්‍ය සහකාර පාලක 2.කළමනාකරණ සහකාර 3.රියදුරු	01 01 01	0812222770
28. පරිසර	පරිසර නිලධාරි	01	0812203596

5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය

ගෙවී ගිය වසර තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ 27 ක් පමණ නියෝජනය වෙමින් පෙර නොවූ විරූ ලෙස නැවුම් වූ කාර්ය සාධන ඉලක්ක වෙත යොමු වීමටත් එම ඉලක්ක වලින් වැඩි ප්‍රමාණයක් සාධනය කර ගැනිමට හැකිවීමත් දිස්ත්‍රික්කයේ ජනතාව මෙන්ම පොදුවේ රටත් ලැබූ ජයග්‍රහනයක් ලෙස අප විශ්වාස කරමු. විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බාහිර හා අභ්‍යන්තර ස්වරූපය, පිරිසිදුකම, පිළිවෙල, කාර්යාල පිරිසැකැස්ම හා දර්ශනිය භාවය ආරක්ෂාකර ගැනිමට සැලකිය යුතු වෙහෙසක්, උත්සහයක් ගත් අතර මේ සඳහා දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ලෙහි සියළුම අංශ වල මෙන් පිහන් ගඩොල් අතුරා ඉතා ප්‍රියමනාප පිරිසිදු අලංකාර කාර්යාලයක් බවට පත් කෙරින. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාල අභ්‍යන්තරයේ අවශ්‍ය අංශ වල හා ස්ථාන වල තීන්ත ආලේප කිරීමද සිදු කෙරින.

යල් පැන ගිය අබලන් වූ ලී බඩු උපකරණ වෙනුවට නව ලී බඩු කාර්යාල උපකරණ ලබා දෙන ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රැස්වීම් ශාලාව නව ශ්‍රව්‍ය, දෘෂ්‍ය උපකරණ යොදා ඉඩ පාඩු මනාව කළමනාකරණය කර සියළුම පහසුකම් වලින් යුතු ප්‍රියමනාප ස්ථානයක් බවට සකස් කෙරින. 2010, 2011 ජාතික ඵලදායිතා තරහාවලියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර තරහයෙන් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළමු ස්ථානය හිමි කර ගැනීමට ලැබීම අප ලැබූ ජයග්‍රහනයකි.

එසේම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන්ගේ පරිගණක දැනුම හා තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ නිපුණතා ප්‍රවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරන ලදී. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි මධ්‍යම පලාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හා ගඟවට කෝරලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලැබූ සහය ප්‍රශංසනීයයි. එහිදී මෙම ආයතන අතර අන්‍යෝන්‍ය සහයෝගයෙන් සාකච්ඡාවෙන් පුළුල් අරමුණු කරා ප්‍රවේශ විමට අවශ්‍ය පදනම ගොඩනැගින.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉහත සඳහන් කල සෑම අංශයකම මෙන්ම 5-S සංකල්පයෙන් එහා ගිය ඵලදායිතා ක්‍රමවේද, උපායමාර්ග හා නිර්මාණ භාවිතා කරමින් දෛනික රාජකාරි කටයුතු වල නිරත විය. ඒ සඳහා ලිපි ගොනු, ලිපිගොනු රාක්ක සකස් කර ගැනිම මෙන්ම පරිගණක තාක්ෂණය භාවිතය සමඟ ලිපිගොනු නඩත්තුව හැකිතාක් දුරට අවම කරගැනීමටත් සරල කර ගැනීමටත් හැකිවිය. මේ සියල්ලටම වඩා කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා ඉතා වේගයෙන් වැඩිදියුණු කරගත් අතර මානව හිතකාමී ආකල්පවලින් පෝෂණය වීම ආරම්භ වීමත්, ඒ සමඟ නව ආකාරයෙන් සිතීමටත් නව සංකල්ප හරහා මහජනතාවට අලුත් දෙයක් ලබාදීමට උත්සහ ගත්හ. මේ සඳහා නිලධාරින්ට විවිධ පුහුණුවීම් වලට සහභාගි වීමට ඇති අවස්ථා වැඩිකල අතර ඊට අමතරව විවිධ විෂය පථයන් හරහා මසකට අවම වශයෙන් එක් පුහුණුවක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධානය කෙරින. මේ සියළු එකතු කිරීම් තුලින් බලාපොරොත්තු වූ කාර්යක්ෂම හා ගුණාත්මක මහජන සේවය වර්ධනය වීම සතුටට කරුණකි. ඒ බව වර්ෂය අවසානයේ පවත්වන ලද මහජන සේවා පිළිබඳ සමීක්ෂණයෙන් එළිදරවු විය. මේ සියල්ලටම ඉතා ප්‍රබලව බලපාන ලද්දේ නායකත්වයයි. එනම් ඉහල කළමනාකරණය විසින් කාර්ය මණ්ඩලය වෙත ඇති කරන ලද පෙළඹවීම ඉතා සුහදශීලිව කාර්ය මණ්ඩලයේ අදහස් උදහස් වලට ඇහුම්කන් දෙමින් සාකච්ඡාවෙන් සම්මන්ත්‍රණයෙන් කටයුතු කිරීමත් මෙයට හේතුවිය. මාසිකව පවත්වන ලද අංශ ප්‍රධාන ප්‍රගති සමාලෝචන රැස්වීම හා අනෙකුත් කාර්ය මණ්ඩල රැස්වීම් මේ සඳහා සාර්ථකව භාවිතයට ගනු ලැබීය.

මේ සියළු පියවරයන් හරහා කරන ලද කැපකිරීම් වල ප්‍රතිඵලයක් ලෙස ISO 9001 – 2008 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය හිමිකර ගැනීමට හැකිවීම අප ලැබූ සුවිශේෂ තත්වයක් වන අතර මෙම තත්වය ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 හිද ව්‍යාප්ත කිරීම මීලග ඉලක්කය වන අතර තත්වය දිගින් දිගට පවත්වාගෙන යාම අපගේ අරමුණ වේ.

5.1 කමිටු පැවැත්වීම.

දිස්ත්‍රික් පරිපාලනය ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය ලෙස දිස්ත්‍රික්කයේ විවිධ වූ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව පවත්වනු ලබන සියලු කමිටු හා රැස්වීම් නියමිත පරිදි පවත්වා ඒ තුලින් ඉහළ කාර්ය සාධනයක් අත්පත් කරගන්නා ලදි.

පවත්වන ලද කමිටුව	වාර ගණන
❖ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව	11
❖ දිස්ත්‍රික් සංවර්ධන / සැලසුම් කමිටුව	11
❖ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව	11
❖ දිස්ත්‍රික් පරිසර කමිටුව	06
❖ දිස්ත්‍රික් මිළ කමිටුව	02
❖ දිස්ත්‍රික් නිවාස කමිටුව	06
❖ දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ රැස්වීම්	02
❖ දිස්ත්‍රික් නගර සංවර්ධන කමිටුව	03
❖ හන්තාන කළමණාකරණ කමිටුව	08

5.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය සාධනය

පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2008 ජාතික මට්ටමේ ඵලදායිතා තරඟයෙන් ප්‍රථම ස්ථානය කාර්යාල කළමනාකරණ තරඟයෙන් ප්‍රථම ස්ථානයත් ලබාගැනීමට හැකිවීමත් 2009 ජාතික ඵලදායිතා තරඟයෙන් හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පළමු ස්ථානය ලබා ගැනීමට හැකි වීම සහ 2010, 2011 ජාතික ඵලදායිතා තරඟයෙන් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පළමු ස්ථානයත් හිමිවීම සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම එය ඉහල ප්‍රමිතියකින් යුතු ප්‍රාදේශීය පාලනයක් දිස්ත්‍රික්කයේ ඇති කිරිමට ප්‍රබල සාධකයක් මෙන්ම හොඳ ගැම්මක්ද විය. එපමණක් නොව 2010, 2011 ජාතික ඵලදායිතා තරඟයෙන් අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16ක් සඳහාම විවිධ මට්ටමේ ජයග්‍රහණ ලබාගැනීම මෙයට හොඳ සාක්ෂියකි.

මේ සුවිශාල ජයග්‍රහණයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කලමනාකරණය තුලින් කෙරෙන පෙළඹවීම් හා නිරන්තර නිරීක්ෂණයෙන්, විමර්ශනයෙන්, උපදේශනයෙන් හා සාමූහිකත්වය බෙහෙවින්ම ඉවහල් විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල දියුණුව සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරිම, කාර්යාල උපකරණ යනාදිය ලබාගැනිමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට මැදිහත්වීම ඉතාම උනන්දුවෙන් සිදුකෙරින. ඉදිරි වර්ෂ කිහිපය තුලදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ම ISO 9001 තත්වයට ගෙන යාමේ යහපත් අරමුණු තුල රැදි සිටින අතර දැනටමත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක් මෙම තත්වය ලබාගෙන හා ඉල්ලුම් කර තිබිම සතුටට කරුණකි.

5.3 ප්‍රාදේශීය ලේකම් සමුළු

ප්‍රාදේශීය පරිපාලනය වඩාත් ශක්තිමත් කිරිම සඳහාත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කාර්ය සාධන ඉලක්කයන් සහ ඵලයන් හුවමාරු කර ගැනීමටත් වඩාත් හොඳ ප්‍රගති පාලන ක්‍රමයක් ලෙස ප්‍රාදේශීය ලේකම් සමුළු පැවැත්වීම සාර්ථක වැඩපිළිවෙලක් බවට පත්ව ඇත. ඒ අනුව සෑම මසකම මෙන් චක්‍රාකාරව තෝරාගත් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මෙම සමුළුව පැවැත්වීම සංවිධානය කිරිම සිදු කෙරේ.

5.4 ඵලදායිතා වැඩසටහන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඵලදායීතාවය පවත්වා ගෙන යෑමටත් නව උත්පාදන යෝජනා ලබා ගැනීමේත් අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී විවිධ අංශ සහ දෙපාර්තමේන්තු නියෝජනය වන පරිදි ඵලදායිතා කව පිහිටුවා ඇත. මෙම එක් එක් කවය 2012 වර්ෂයේ පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සකස් කර ක්‍රියාත්මක කරන ලදි

කවයේ නම	ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති
මූල්‍ය ශක්ති	දි.ලේ. හා ප්‍රා.ලේ. කාර්යාල වල ඉන්වෙන්ට්‍රි භාණ්ඩ කළමණාකරණය හා භාණ්ඩ සමීක්ෂණය විධිමත් ඉන්වෙන්ට්‍රිගත ක්‍රමවේදයක් සැකසීම.
අරුණළු	දි.ලේ.කාර්යාලයේ අභ්‍යන්තර සේවා කටයුතු හා සේවා තෘප්තිය මැන බැලීමේ සමීක්ෂණය. කාර්යාල යතුරුපැදි ගාල සකස් කිරීමේ ව්‍යාපෘතිය.
ප්‍රතිභා	2006-2011 ක්‍රියාත්මක වූ ගමනැගුම පිළිබඳ පසු විපරම් නිරීක්ෂණ වාර සැකසීම.
අපේක්ෂා	මහනුවර දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි ප්‍රතිලාභීන් හා දත්ත පද්ධතියක් සකස් කිරීම
ජනිත	සංඛ්‍යාන අත්පොත - 2011
කම්සුරු	මහනුවර දිස්ත්‍රික්කය තුල කලාකරුවන් පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීම
ජීවන ප්‍රදීප	දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ සෞඛ්‍ය ඒකක පිහිටුවීම පිහිටුවීම.
ස්මාර්ට්	පසු සේවා පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.
කළණමිතුරු	ආපදා අවම කිරීමේ ස්වභානුගත ව්‍යාපෘතිය.
මාතලී	මහනුවර දිස්ත්‍රික්කයේරියදුරු බලපත්‍ර අළුත් කිරීම සඳහා ලැබෙන අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව පිරවීමට ක්‍රමවේදයක් සැකසීම.
සහන	සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ගේ හා වෙළඳුන්ගෙන් සිදුවන වැරදි නිවැරදි කර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම.
රන්පත	මහනුවර දිස්ත්‍රික් වතු කම්කරුවන් සඳහා හැඳුනුම්පත් ලබා දීමේ වැඩසටහනක් සැකසීම.
ප්‍රමිති	කිරුම් මිනුම් උපකරණ සත්‍යායනය කිරීම පිළිබඳව වෙළඳ ප්‍රජාව දැනුවත් කිරීම.
හරිත කවය	දි.ලේ.කාර්යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා අභ්‍යන්තර / බාහිර අලංකරණය වැඩිදියුණු කිරීම.

2010 / 2011 ඵලදායිතා තරඟාවලියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රථම ස්ථානය දිනා ගැනීමේ අවස්ථාව.

5.5 ප්‍රකාශන අංශය

ගෙවී ගිය වසරේදී ද වැදගත් ප්‍රකාශන කීපයක්ම එළි දක්වන ලද අතර ශ්‍රී දළදා පෙරහැර උත්සවය නිමිත්තෙන් නිකුත් කළ ශ්‍රී දළදා අභිවන්දන හා දිස්ත්‍රික්කයේ සංවර්ධන තොරතුරු ජනතාව වෙත ලබාදීම සඳහා කැන්ඩි ඊ නිව්ස් 2012 වසරේදීද ප්‍රකාශයට පත් කරනු ලැබීය.

5.6 විශේෂ වැඩසටහන් / සුභසාධනය

- ❖64 වන ජාතික නිදහස් සමරු උළෙල මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී අභිමානවත් ලෙස සැමරීම.
- ❖ඇසළ පෙරහැර මෙහෙයුම් මැදිරිය සම්බන්ධීකරණය.
- ❖වෙසක් උළෙල නිමිත්තෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ වෙසක් කූඩු තරඟයක් පැවැත්වීම.
- ❖අතිගරු ජනාධිපතිතුමාට, රජයට හා ජනතාවට සෙත්පතා නොවැම්බර් මස 18 දින ශ්‍රී දළදා මාළිගාවේ සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පැවැත්වීම.
- ❖මහියංගණ සෑයට වසර 700 ක් පිරීම නිමිත්තෙන් පවත්වන ලද මහා දානමය පිංකම සඳහා පිරිත් රථයක් මහියංගණ විහාරය දක්වා පැදකුනු කිරීම.
- ❖අස්ගිරි මහා විහාරයට වසර 700 ක් පිරීම නිමිත්තෙන් අස්ගිරි මහා විහාරයේ මහා නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් උත්සවය පැවැත්වීම.

2012 රාජ්‍ය වෙසක් උත්සවයේ වෙසක් පහන් කූඩු තරඟයේ ප්‍රථම ස්ථානය දිනාගත් බෝගම්බර බන්ධනාගාරය මඟින් ඉදිරිපත් කරන ලද පහන් කූඩුව

5.7 ග්‍රාම නිලධාරි කටයුතු

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 හි ග්‍රාම නිලධාරි වසම් 1188 ක් ඇත.ආදර්ශ ග්‍රාම නිලධාරි කාර්යාල හා සේවාපියස කාර්යාල සැලකිය යුතු ප්‍රමාණයක් ඉදි කර ඇති අතර 2012 වර්ෂයේ කාර්යාල කිහිපයක ඉදිකිරීම් තවදුරටත් කෙරෙමින් පවති.

මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු - 2012

අනු අංක	ප්‍රාදේශීය ලේකම් කාර්යාල	ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව	දැනට සිටින ග්‍රා.නි. සංඛ්‍යාව	පුරප්පාඩු ග්‍රා.නි. සංඛ්‍යාව
1.	ගඟවට කෝරළේ	64	**55**	**09**
2.	හාරිස්පත්තුව	84	**61**	**23**
3.	පූජාපිටිය	67	**54**	**13**
4.	අකුරණ	35	**29**	**06**
5.	යටිනුවර	95	**54**	**41**
6.	උඩපළාත	49	**32**	**13**
7.	දොළුව	33	**28**	**05**
8.	පාතහේවාහැට	73	**57**	**16**
9.	දෙල්තොට	29	**19**	**10**
10.	පස්බාගේ කෝරළේ	29	**25**	**04**
11.	ගඟඉහළ කෝරළේ	31	**21**	**10**
12.	පාතදුම්බර	52	**31**	**21**
13.	පන්විල	14	**9**	**05**
14.	මැදදුම්බර	94	**71**	**23**
15.	උඩදුම්බර	63	**41**	**22**
16.	මිනිපේ	48	**28**	**20**
17.	කුණ්ඩසාලේ	80	**51**	**29**
18.	උඩුනුවර	124	**96**	**28**
19.	තුම්පනේ	67	**38**	**29**
20.	හතරලියද්ද	57	**36**	**21**
එකතුව		**1188**	**836**	**348**

5.8 රාජ්‍ය සේවා පුහුණු ආයතන කටයුතු

2012 වර්ෂයේදී පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 40 ක් සඳහා විවිධ තනතුරු වල නිලධාරීන් 1300 ක් පමණ පුහුණුවීම් කටයුතු හදාරා ඇති අතර ඒ සඳහා රු. 950,908.00ක පමණ මුදල් ප්‍රතිපාදන වැය කර ඇත. රජයේ නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහල නැංවීම සඳහා කටුගස්තොට රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පරිගණක විද්‍යාගාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර අවසන් කර ඇත. ඒ සඳහා දැනට රුපියල් 1,625,000.00 ක පරිගණක උපකරණ මිලදී ගෙන ඇත.

I.රාජ්‍ය සේවා පුහුණු ආයතන ප්‍රතිපාදන
II.මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රතිපාදන
III.ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන

ඉහතින් සඳහන් කළ පුහුණු කටයුතු වලට අමතරව මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් SLIDA ආයතනයේ පුහුණු සඳහා යොමු කිරීම ද අනිකුත් පුහුණු ආයතන හා රාජ්‍ය ආයතන විසින් පවත්වනු ලබන පුහුණු සඳහා නිලධාරීන් සහභාගී කරවීමද සිදු වූ අතර රාජ්‍ය නොවන සංවිධානයන් සමඟ ඒකාබද්ධව ග්‍රාම නිලධාරීන් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු කිහිපයක් සංවිධානය කර පවත්වන ලදි.

5.9 දිස්ත්‍රික් මෙහෙයුම් මැදිරිය

දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන සමාජ ආර්ථික සංවර්ධන වැඩ සටහන් වල ප්‍රගතිය අඛණ්ඩව සොයා බලා යාවත්කාලීන කරන හා සමාජ ආර්ථික සංවර්ධන දත්ත හා මූලික දත්ත තොරතුරු එකතුවක් ද සහිතව ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් මෙහෙයුම් මැදිරිය යාවත් කාලීනව පවත්වාගෙන යනු ලැබීය.

ඒ තුලින් දේශපාලන අධිකාරිය, ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන්, පර්යේෂකයන්, ශිෂ්‍ය ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු ආයතන හා පුද්ගලයින්ට අවශ්‍ය දත්ත තොරතුරු පහසුකම් සැපයීම සාර්ථකව සිදුකරනු ලැබීය.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මෙහෙයුම් මැදිරි ඒකාබද්ධ කිරීම වැඩසටහනක් පසුගිය වසරේදී ක්‍රියාත්මක කරනු ලැබූ අතර මෙම වසරේ එය යාවත්කාලීනව පවත්වාගෙන යන ලදි

5.10 මහනුවර සංචාරක නිවාස කටයුතු

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ වෙන මහනුවර බහිරවකන්ද සංචාරක නිවාසය 1999 සැප්තැම්බර් 02 දින ආරම්භ කරන ලද අතර එය බහිරවකන්ද විහාරස්ථානය පාමුල මනරම් කඳුවැටියක පිහිටා ඇත. මෙම සංචාරක නිවාසයට මහනුවර නගරය අලංකාරව දර්ශනය වේ

මෙහි නාන කමර පහසුකම් සහිත නිදන කාමර තුනක්, කෑම කාමරය, ආලින්දය හා මුළුතැන්ගෙයකින් සමන්විත වේ. රාජකාරි කටයුත්තක් සඳහා නේවාසික විම සඳහා කාමරයට රු: 250.00 ද වෙනත් කටයුත්තකදි නිවාඩු ගැනීම සඳහා කාමරයට රු:300.00 ද ලෙස ගාස්තු අය කරයි. 2012 වර්ෂය තුල කාමර 1211 වාරයක් වෙන්කර රු: 131,400ක ආදායමක් උපයා ඇත.

5.11 පරිගණක හා තොරතුරු තාක්ෂණය

දිස්ත්‍රික් වෙබ් අඩවිය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වයෙන් නිර්මාණය කරන ලද මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය වෙබ් අඩවිය (www.kandy.dist.gov.lk) සිංහල. දෙමළ. ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර මේ වන විට එහි පහත සඳහන් වැඩිදියුණු කිරීම් සිදුකර ඇත.

1. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මගින් නිර්මාණය කරනු ලබන Kandy e-News මාසික පරිගණක සඟරාව වෙබ් අඩවියට ඇතුලත් කර තිබීම
2 මහනුවර දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවන්ගේ නාමලේඛනය වෙබ් අඩවි ගත කිරීම.
3. මහනුවර දිස්ත්‍රික්කයේ සංඛ්‍යා ලේඛන දත්ත හා ප්‍රයෝජනවත් සිතියම් වෙබ් අඩවිය හරහා ලබා ගැනීමේ පහසුකම් සලසා තිබීම.
4. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ කටුගස්තොට පුහුණු ඒකකයේ වැඩසටහන් පිළිබඳ තොරතුරු හා කාල සටහන් වෙබ් අඩවි ගත කිරීම.
5. මහනුවර රාජ්‍ය සේවා නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා පරිගණක නිපුණතා ප්‍රවර්ධන ඒකකයක් පිහිටුවීම හා පරිගණක පුහුණු පැවැත්වීම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පරිගණක ජාලය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මහනුවර දිස්ත්‍රික්කයේ සියඵම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල පරිගණක ජාල සම්බන්ධ කෙරෙමින් ප්‍රාදේශිය පරිගණක ජාලයක් නිර්මාණය කර ගැනීමට හැකිවිය. මෙමගින් සියඵම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය **File Server** හි වෙන වෙනම **Folder** ස්ථාපිත කොට ඔවුනට වෙන වෙනම රහස් අංක ලබාදී දත්ත හා වටිනා තොරතුරු (විශ්‍රාම වැටුප් තොරතුරු. මාසික ගිණුම් සාරාංශ. ප්‍රතිපාදන වෙන්කිරීම් ආදිය) ඝපණිකව. රහස්‍යතාව උපරිම ලෙසින් පවත්වා ගනිමින් හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසී ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත යැවෙන E-Mail මගින් යැවීමේ ප්‍රතිශතය 70% සිට 90% දක්වා ඉහළ නංවාගෙන ඇත.

e කවය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් ගේ තොරතුරු තාක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ පරිගණක ජාල පද්ධතියේ වැඩි දියුණු කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම සහ රාජකාරී කාර්යක්ෂමව සහ ගුණාත්මකව, ඉටු කිරීම සඳහා වන පරිගණක දත්ත පද්ධති පවත්වාගෙන යාමටත් නව ක්‍රියාවලීන් එළිදැක්වීමේ අරමුණින් මෙම e කවය ස්ථාපිත කරන ලදි.

e කවයේ ක්‍රියාකාරකම්

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ හැකියාව මැන බැලීම සඳහා කරන ලද සමීක්ෂණ
- කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා ඉන්ටර්නෙට් හා ඊ මේල් භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා දීම.
- පරිගණක ආරක්ෂිත මෘදුකාංග ස්ථාපිත කර යාවත් කාලීන කිරීම
- පරිගණක යන්ත්‍ර සේවා කිරීම
- මෘදුකාංග එකතුවක් පවත්වාගෙන යෑම

6 සාමාන්‍ය පරිපාලනය

6.1 ආයතන අංශ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන කටයුතු මඟින් කාර්යාලයේ පරිපාලන සහ අනිකුත් අංශ කටයුතු සම්බන්ධීකරණය තුලින් සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික හා පාරිසරික අංශයන්ගේ සංවර්ධනය සඳහා මහත් වූ දායකත්වයක් ලබාදේ.

ආයතන සංග්‍රහයට හා රාජ්‍ය පරිපාලන හා චක්‍රලේඛ වලට අනුව දිස්ත්‍රික් පරිපාලන මෙහෙයවීමට සහ රජයේ අනිකුත් ආයතන, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගලික අංශය අතර මනා සම්බන්ධීකරණයක් ඇති කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු සිදු කරයි.

2012 වර්ෂයේ ආයතන අංශ කටයුතු

1. 2012 වර්ෂයේ කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, ස්ථීර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු හා විශ්‍රාම ගැන්වීම් කටයුතු.

අනු අංකය	ක්‍රියාකාරකම / උප ක්‍රියාකාරකම	ප්‍රමාණය
1.	මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ ආයතන කටයුතු	
